**ST. JOSEPH'S COLLEGE – COLOMBO – 10**

**SECOND TERM EVALUATION – JULY 2021**

Grade 7 **SINHALA** Time: 2 Hours

| Class No: …………….... | Name: ……………………………………….... | Class: ……………… |
|---|---|---|

---

- ***ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.***

- පහත සඳහන් වාක්‍යවල ඉරි ඇඳි කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන ප්‍රකාශය තෝරා යටින් ඉරක් අඳින්න.

(01). ශ්‍රී ලංකාවේ ප්‍රධාන **අපනයන** මාර්ගවලින් එකක් ලෙස ඇඟලුම් කර්මාන්තය සැලකේ.

(1). මෙරට සඳහා නිෂ්පාදනය වන (2). පිටරටින් මෙරටට ගෙන්වන

(3). මෙරටින් පිටරට යවන (4). මෙරටින් බැහැර ගිය

(02). මෙම **සහස්‍රකය** මුහුණදෙන ප්‍රධාන ගැටලුව බවට පත්ව ඇත්තේ ස්වභාවික ව්‍යසනයන් ය.

(1). ලක්ෂයකින් සමන්විත ඒකකය (2). දහයකින් සමන්විත ඒකකය

(3). සියයකින් සමන්විත ඒකකය (4). දහසකින් සමන්විත ඒකකය

(03). 'මුහුද' යන පදයට සමාන පදයක් නොවන්නේ,

(1). සයුර (2). රුවනාර

(3). සිඳු (4). මුවදොර

(04). 'කනක' යන පදයට සමාන පදයක් වන්නේ,

(1). මුතු (2). මැණික්

(3). රත්තරන් (4). දියමන්ති

(05). මුලින් දී ඇති වචනයට විරුද්ධාර්ථයක් දෙන පිළිතුර තෝරන්න.

(1). සදොස් - නිදොස් (2). අරවින්ද - අම්බුජ

(3). දේශප්‍රේම - දේශානුරාගී (4). සකුණ - විහඟ

EXAMRESULTS.LK

(06). නූතන සිංහල වර්ණ මාලාවේ මුළු අක්ෂර ගණන කීයද ?

(1). 54 (2). 61

(3). 60 (4). 62

(07). සඤ්ඤක අක්ෂරයක් යෙදී ඇති පදය තෝරන්න.

(1). අවබෝධය (2). ඡේදය

(3). භාෂාව (4). සඳකැන්

(08). මහාප්‍රාණ අක්ෂරයක් ඇතුළත් නොවන පිළිතුර තෝරන්න.

(1). ඛණිජ (2). ඝණ්ටාකාර

(3). කාලය (4). ධනය

***09 සිට 10 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති වචනවල හිස්තැනට ගැළපෙන අක්ෂර පේළිය තෝරන්න.***

(09). (I) . සුදර්.........න (II). උද්........ච්ච

(III). උ......රාබාධය (IV). විස්මයාර්.........

(1). ශ, ධ, ඨ, ද (2). ශ, ධ, ද, ඨ

(3). ශ, ද, ධ, ඨ (4). ද, ඨ, ධ, ශ

(10). (I). පුස්......කාලය (II). පරිහර......ය

(III). පිළිවෙ.......... (IV). නිශ්..........ල

(1). ත, ණ, ළ, ච (2). ඨ, භ, ල, ජ

(3). න, න, ළ, ච (4). ඨ, ණ, ල, ච

- ***කමත් බස අනුව පහත දැක්වෙන වචනවලට සමාන පද තෝරන්න***

(11). **කලවිට -** (1). කළය (2). කමත (3). බුලත් විට (4). කෙවිට

(12). **කිරි කබළු -** (1). කිරි පබළු (2). කිරිබත් (3). ආප්ප (4). කිරි අලුවා

(13). "අයියා සරුංගලය **සාදා** උඩ **යවමින්** සතුටු වෙයි." ඉරි ඇඳි ක්‍රියාපද නිවැරදිව පිළිවෙළින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1). පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා (2). විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා

(3). මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා (4). පූර්ව ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා

(14). නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය තෝරන්න.

(1). විශිෂ්ඨ (2). ලේකන

(3). ලේකම් (4). ගන්ධාර

(15). ''ඔවුහු'' යන පදය අයත් වන්නේ,

(1). උත්තම පුරුෂ ඒක වචනයට ය. (2). මධ්‍යම පුරුෂ බහු වචනයට ය.

(3). ප්‍රථම පුරුෂ බහු වචනයට ය. (4). මධ්‍යම පුරුෂ ඒක වචනයට ය.

- ***සුදුසු ආඛ්‍යාත පදය තෝරා යටින් ඉරක් අඳින්න.***

(16). ගෙවල් ගින්නෙන් විනාශ ( විය / වූහ )

(17). රළ පෙළ වෙරළෙහි ( හැපෙයි / හැපෙති )

(18). පියුම්හු විල අලංකාර ( කරයි / කරති )

(19). වෘක්ෂලතාවෝ මලින් බර ( වෙයි / වෙති )

(20). ගොයම් පැළ නියඟයට ( මැරෙයි / මැරෙති )

*(ලකුණු 2 × 20 = 40)*

## II කොටස

---

- ***පළමු ප්‍රශ්නය ඇතුළුව <u>ප්‍රශ්න පහකට</u> පමණක් පිළිතුරු සපයන්න.***

01. (i). රාජකාරි ලිපියක ආකෘතික ලක්ෂණ ලියන්න.

(ii). ඔබේ සම්පූර්ණ නම හා පාසලේ ලිපිනය නිවැරදිව ලියා දක්වන්න.

(iii). පහත සඳහන් කවිවල කතුවරුන් නිවැරදිව සොයා යා කරන්න.

| | |
|---|---|
| දිලිහි දිලිහි ආකාසේ<br>බබළන මල් තාරුකා | තොටගමුවේ ශ්‍රී රාහුල හිමි |
| හා හා හරි හාවා<br>කැලේ මැදින් ආවා | ආනන්ද රාජකරුණා මහතා |
| දවල් තිස්සෙ පඳුරු අස්සෙ<br>හැංගෙන පොඩි හාවා | මුනිදාස කුමාරතුංග මහතා |
| මා වැනි බිලින්දා<br>වර වර ළඟට කැන්දා | ඇස්. මහින්ද හිමි |

(iv). පහත සඳහන් ග්‍රන්ථයන්හි කතුවරුන් වරහන් තුළින් තෝරා ලියන්න.

සේපාලිකා -
අඹ යහළුවෝ -
අක්කර පහ -
සිංහල ක්‍රිස්තියානි සාහිත්‍ය වංශය -

( අතිගරු එඩ්මන් පීරිස් රදගුරු හිමි, මඩවල එස්. රත්නායක මහතා,
ටී.බී. ඉලංගරත්න මහතා, ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ මහතා )

(ලකුණු 8+4+4+4= 20)

02. පෙළපොත ඇසුරින් පිළිතුරු සපයන්න.

➢ **පහත උද්ධෘත පාඨ කවුරුන් විසින් කාට පවසන ලද්දේ දැයි ලියන්න.**

(i). ''ඊට තොප වික්ෂේප නොව; තොපගෙන් කෑ තලවලට මම මිල දෙමි.''

1. 2.

(ii). ''අයියේ තේ කහට වලට නේද, රතු ගඟුල කියන්නේ ?''

1. 2.

(iii). ''පමා වීමට කිසි ම උවමනාවක් නැහැ. එහෙයින් හරකුන් මුදා හැරියොත් මම තව මොහොතකින් ඔවුන් මරා කමි''

1. 2.

(iv). ''කම්මැළි රාළ! මම වැඩ පටන් ගත්තා විතරයි. දවසේ වැඩ ඉවර කරලා එනවා දැ ?''

1. 2.

(v). ''මම අද මේ දරුවන්ට පැහැදිලි කරන්නට සූදානම් වෙන්නේ අදහස් හුවමාරු කර ගැනීමේදී අප සැලකිලිමත් විය යුතු කරුණු ගැනයි''

1. 2.

(ලකුණු 2×5- 10)

03. කෙටි පිළිතුරු ලියන්න.

(i). 'සිනා කුමරි' කවි පන්තිය රචනා කළේ කවු ද?

(ii). පන්සිය පනස් ජාතක පොත රචනා වූ යුගය කුමක් ද?

(iii). සද්ධර්මාලංකාරයේ එන අහිකුණ්ඨිකයන් ගැන කියවෙන කතා පුවත කුමක් ද?

(iv). අප සතුව ඇති පැරණිම සිංහල ව්‍යාකරණ ග්‍රන්ථය කුමක් ද?

(v). ගොවි බිරියගේ නුවණ කුමන රටක ජන කතාවක් ද?

(ලකුණු 2×5= 10)

04. පුරුදු නො කළහොත් දින / දින
නිසි පල නො ලැබෙයි අකු / රින
ආදරයෙන් බැතින් එ / යින
අකුරු පුරුදු කරනු නි / තින

නුවණ ලබාදෙන / දෙවියෝ
අකුරුය ඉන් නොවනු / වියෝ
එ අකුරු මැනවින් / සෙවියෝ
වෙති රට සලකන / දෙවියෝ

(කුමරතුංග මුනිදාස මහතා.)

(i). ඉහත කවිය රචනා කර ඇත්තේ කවු ද?

(ii). ඉහත කවියට අනුව නුවණ ලබා දෙන්නේ කවු ද?

(iii). පහත සඳහන් වචන සඳහා සමාන පද කවියෙන් තෝරා ලියන්න.

* අක්ෂර * ඥානය

(iv). පහත පදවලට විරුද්ධ පද ලියන්න.

* ආදරයෙන් * පුරුදු

(v). අකුරුවලින් නිසි ඵල ලැබීමට අප කුමක් කළ යුතු ද?

(vi). දෙවෙනි කවියේ එන **මූර්ධජ අක්ෂරයක්** ලියන්න.

(vii). මෙහි එන විධි ක්‍රියාවක් ලියන්න.

(viii). දෙවියෝ යන පදයේ අනුක්ත පදය ලියන්න.

*(ලකුණු = 10)*

05. පහත ඡේදය කියවා පිළිතුරු සපයන්න.

''භාෂාව වනාහි මනුෂ්‍යයන් විසින් නිපදවන ලද ව මනුෂ්‍ය සමාජයෙහි ව්‍යවහාර කරනු ලබන යම් උපකරණයක් වේ. මනුෂ්‍ය සමාජයත්, සියොතුන් සිවුපාවුන් ආදී සත්වයන්ගේ සමාජයත් අතර එක් වෙනසක් නම් මනුෂ්‍ය සමාජයෙහි භාෂාව ව්‍යවහාර කිරීම බව කිව හැකි ය.

සතුන්ගේ සමාජයෙහිත් එක්තරා විදියක භාෂා විලාසයක් ව්‍යවහාර කෙරෙන්නේ යැයි කෙනෙකු කියන්නට පුළුවන. එහෙත් මේ භාෂාව භය, බඩගින්න ආදිය ප්‍රකාශ කිරීමටත්, පැටවුන් කැඳවීමටත් කරන හැඬලීමට සීමා වූවක් බැවින් එය නියම වශයෙන් භාෂාවක් ලෙස හැඳින්වීම යෝග්‍යය යි නො පෙනේ.''

මහචාර්‍ය එදිරිවීර සරච්චන්ද්‍ර
සාහිත්‍ය විද්‍යාව කෘතිය

(i). මෙය උපුටාගත් කෘතිය කුමක් ද?

(ii). මෙය රචනා කොට ඇත්තේ කවු ද?

(iii). ඡේදයට අනුව භාෂාව හඳුන්වා ඇත්තේ කෙසේ ද?

(iv). ඡේදයේ සඳහන් සමාජ දෙක නම් කරන්න.

(v). මනුෂ්‍ය සමාජයත්, සත්වයන්ගේ සමාජයත් අතර ඇති වෙනස කුමක් ද?

*(ලකුණු 2×5 = 10)*

06. පහත සඳහන් පදවල අරුත් පහදන්න.

(i). පුරෝගාමියා

(ii). ජීවනෝපාය

(iii). බැත

(iv). සහජීවනය

(v). බඩසයින්

- පහත සඳහන් උක්ත පද සඳහා සුදුසු අනුක්ත පද ලියන්න.

(vi). මම

(vii). කුරුල්ලා

(viii). ළමයි

(ix). හාවෙක්

(ix). දැරියක්

*(ලකුණු 1×10 = 10)*